සැ. යු. - 2023.01.20 දින පළ වූ අංක 2316 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,317 - 2023 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2023.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 274 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 278 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 පෙබරවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

273- B 82423— 5,403 (2023/01)

# පළාත් පාලන නිවේදන

## මීගමුව මහා නගර සභාව

2023 පරිපූරක අයවැය ලේඛන අංක 01

මීගමුව මහා නගර සභාවේ 2023.02.07 වැනි දිනට පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිත 2023 වර්ෂයේ පරිපූරක අයවැය ලේඛනය 2023.01.31 වැනි දින සිට දින 07 ක් මහජන ප්‍රදර්ශනය සඳහා නාගරික ගණකාධිකාරී දෙපාර්තමේන්තුවේ තබා ඇති බව 252 අධිකාරිය මහා නගර සභා ආඥාපනතේ 214(ආ) යටතේ දැනුම් දෙමි.

ඩබ්. එම්.දයාන් ලාංසා,
නගරාධිපති,
මහා නගර සභාව,
මීගමුව.

02-312

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාර ඌව පළාත් සභාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ, දියතලාව, හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ ඇති මංමාවත් හපුතලේ ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.


මෙම නිවේදනයේ අංක 2298 හා 2022.09.16 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වී ඇති අතර විරෝධතා ඉදිරිපත් කිරීමට පනවා තිබූ කාල සීමාව තුළ මෙම මාර්ගය සම්බන්ධයෙන් කිසිදු විරුද්ධත්වයක් ඉදිරිපත් වී නොමැති හෙයින් මෙම උපලේඛනයේ සඳහන් මංමාවත් හපුතලේ ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවට මාර්ග සිතියම් සහිතව *ගැසට් පත්‍රයේ* පළ කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2023 ජනවාරි මස 18 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | වැවේ වත්ත මහගලහින්න පොදු සුසානභූමියට යන මාර්ගය (387 දරන පිඹුරේ අංක 785 දරන පාර) |
| පාරේ දිග | - | මීටර් 130 |
| පාරේ පළල | - | මීටර් 06 |
| ග්‍රාම නිලධාරී වසම | - | ඇල්ලගම |


SUPPLEMENT No. 8
FINAL PLAN
1:4000
VILLAGE
D. R. O.'S DIVISION
DISTRICT
PROVINCE
Reference
Boundaries pointed out by
Boundaries pointed out to
A.K.A.W. de Silva
Surveyor, Survey Department
1987.10.21
Supdt. of Surveys
On behalf of the Surveyor General

අවසාන FINAL | පල PLAN No. පිඹුරු අංකය 387 | අවසාන FINAL | පරිපූරක ඉඩම් භුක්ති ලේඛනය SUPPLEMENTARY TENEMENT LIST (88) | 84 වැනි පිඹුරු බලපත්‍ර | 381(අ)

දිස්ත්‍රික්කය DIS.

ප. PRO.

ක්ෂේ. ප. අංකය F. S. No. / ක්ෂේ. පො. අංකය F. B. No. } 84 වැනි පිඹුරු බලපත්‍ර

මැනීමේ නියමය Reqn. for Survey 84 වැනි පිඹුරු බලපත්‍ර

ඌව

| ඉඩම් කැබැල්ල Lot | නම Name | විස්තරය Description | හෙක්ටෙයාර් Hectares | රේඛා චිත්‍රය Diagram | නියමුනු කරුණු Remarks (හෙක්ටෙයාර් 1 = අක්කර 2.47 / 1 Hectare = 2.47 Acres) |
|---|---|---|---|---|---|
| 782 | මැරේ වත්ත | ගෙවත්ත<br>අවුරුදු 25 ක් වයසැති මිශ්‍ර වගාව | 0 · 032 | | 670 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්<br>මායිම් : උතුර - 785 සහ 781 වැනි ඉඩම් කැබලි ; නැගෙනහිර - 781 වැනි ඉඩම් කැබැල්ල<br>දකුණ - 781 සහ 816 2/3 වැනි ඉඩම් කැබලි ; බටහිර - 785 වැනි ඉඩම් කැබැල්ල<br>ඉ.සං.ආ. පනත යටතේ බලපත්‍ර අංක 149 අනුව ආර්.පී.සී. ප්‍රනාන්දු අප්පුහාමි විසින් 783 වැනි ඉඩම් කැබැල්ලත් සමග වගාකර ඇත. ජී. ඇම්. පොඩිහාමිගේ වගාව වැඩිදියුණු කරගෙන සිටී.<br>සුදුස්සෙක් කිරීම සඳහා |
| 783 | එම | ගෙවත්ත<br>අවුරුදු 25 ක් වයසැති මිශ්‍ර වගාව සහ ස්ථිර ගොඩනැගිල්ලක් ද ඇත | 0 · 167 | | 670 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්<br>මායිම් :- උතුර - 785 වැනි ඉඩම් කැබැල්ල ; නැගෙනහිර - 785 වැනි ඉඩම් කැබැල්ල<br>දකුණ - 785, 812 1/2 සහ 813 වැනි ඉඩම් කැබලි ; බටහිර - 784 වැනි ඉඩම් කැබැල්ල<br>ඉ.සං.ආ. පනත යටතේ බලපත්‍ර අංක 149 අනුව ආර්.පී.සී. ප්‍රනාන්දු අප්පුහාමි විසින් 782 වැනි ඉඩම් කැබැල්ලත් සමග වගාකර ඇත. ජී. ඇම්. පොඩිහාමිගේ වගාව වැඩිදියුණු කරගෙන සිටී.<br>සුදුස්සෙක් කිරීම සඳහා |
| 784 | එම | ගෙවත්ත<br>අවුරුදු 20 ක් වයසැති මිශ්‍ර වගාව සහ ස්ථිර ගොඩනැගිල්ලක් ද ඇත. | 0 · 181 | | 670 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්<br>මායිම් : උතුර - 785 වැනි ඉඩම් කැබැල්ල ; නැගෙනහිර - 783 වැනි ඉඩම් කැබැල්ල<br>දකුණ - 812 2/2 වැනි ඉඩම් කැබැල්ල ; බටහිර - 785 වැනි ඉඩම් කැබැල්ල<br>හේරත් මුදියන්සේලාගේ ජිනදාසබණ්ඩා විසින් අනවසරයෙන් වගා කර ඇත. |
| 785 | එම | මාර්ගය සහ මාර්ගය දිගේ වෙන් කල තීරුව | 0 · 375 | | 61, 410 සහ 670 වැනි ඉඩම් කැබලිවල කොටස<br>ප්‍රවේශ මාර්ගය සඳහා වෙන් කිරීම |
| 786 | ඉබ්බාන්වැව පතන | පතන | 2 · 376 | | 410 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්<br>මායිම් :- උතුර - 41 1/2, 42, 405, 403 සහ 755 වැනි ඉඩම් කැබලි ; නැගෙනහිර - 760, 762, 763, 765, 774 සහ 809 වැනි ඉඩම් කැබලි ; දකුණ - 787, 790, 796 සහ 812 1/2 වැනි ඉඩම් කැබලි ; බටහිර - 799, 797, 798 සහ 800 වැනි ඉඩම් කැබලි.<br>පිඹුර සම්පූර්ණ කිරීම සඳහා කොටස් දෙක යොදා ලදී. |
| 787 | එම | කෝ<br>අවුරුදු 20 ක් වයසැති කෝ වගාව | 0 · 163 | | 410 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්<br>මායිම් :- උතුර - 786 සහ 812 1/2 වැනි ඉඩම් කැබලි ; නැගෙනහිර - 812 1/2 වැනි ඉඩම් කැබැල්ල<br>දකුණ - 790 සහ 812 1/2 වැනි ඉඩම් කැබලි ; බටහිර - 786 සහ 790 වැනි ඉඩම් කැබලි<br>යාබද 812 1/2 වැනි ඉඩම් කැබැල්ලේ අයිතිවාසිකම් හිමිකම් ලබන ආර්.ඒ. චාලට් පෙරේරා ; ආර්.ඒ. [illegible] පෙරේරා ; ආර්.ඒ. ඥානලතා පෙරේරා, ආර්.ඒ. කමලා පෙරේරා සහ ආර්.ඒ. මැගී පෙරේරා යන [illegible] විසින් අනවසරයෙන් අල්ලාගෙන ඇත. |

සත්‍ය පිටපතක් බව සහතික කරමි.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
[illegible] ලේකම් කාර්යාලය.

මැනීම හා ඇඳීම කලේ Surveyed and Drawn by ... 19 ... in ... මාසයේ දිය ... 19

මායිම් පෙන්වා දුන් අය Boundaries pointed out by } 93 වැනි පිඹුරු බලපත්‍ර

මායිම් බලාගත් අය Boundaries pointed out to

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු තැන Surveyor Survey Department

පරීක්ෂා කලේ Checked by

(ඩබ්.බී. Herath O.C.P.)

01-339

......... කො. සාර මැනුම් අධිකාරි Supdt. of Surveys .........

සර්වේයර් ජනරාල් වෙනුවට On behalf of the Surveyor General

Dated

3

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2022.09.08 වැනි දින මහ සභා තීරණ අංක 5-II යටතේ සම්මත කර ඇති යෝජනාව, වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහයක (10%) ට සමාන බද්දක් පනවා අය කළ යුතු යැයි ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥ පනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමටත්, පෙරකී ගැසට් පත්‍රය පළ කරන මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද මහ සභාව යෝජනා කරන්නීය."

01-249

---

## බළන්ගොඩ නගර සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි වගන්තිය)

මෙහි පහත සඳහන් උපලේඛනයන්හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයේ ගෝ ඝාතක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා 2023 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා බළන්ගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දහතර (14) ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 වැනි අධිකාරිය හෙවත් ගෝ ඝාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2023 ජනවාරි මස 13 වැනි දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාල සීමාව* |
|---|---|---|---|
| 01 | මොහොමඩ් ෆලීල් මොහොමඩ් රවුෂාන් | බළන්ගොඩ කහටපිටිය පාර, වරිපනම් අංක 51/3 දරන ස්ථානය | 2023.02.01 සිට 2023.12.31 දක්වා |

**උපලේඛනය 02**

| අනු. අංකය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 01 | අබ්දුල් මුත්තාලිෆ් මොහොමඩ් රෙම්ෂීන් | පොදු වෙළඳසැල අංක 15 දරන එළුමස් කඩ කාමරය | එළු මස් අලෙවිය |
| 02 | මොහොමඩ් රියාල් මරික්කාර්අන්වර්දීන් | පොදු වෙළඳසැල අංක 16 දරන ගවමස් කඩ කාමරය | ගව මස් අලෙවිය |

01-303

# විවිධ දැන්වීම්

## වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

### චංචල නිශ්චල ව්‍යාපාර වෙනුවෙන් සංවර්ධන ගාස්තු අය කිරීම

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ 18(ආ) II වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභා සීමාව තුළ දක්නට ලැබෙන ව්‍යාපාර වෙනුවෙන් පහත සඳහන් පරිදි සංවර්ධන ගාස්තු අය කිරීම 2022.12.12 වැනි දිනයේ පැවති විශේෂ රැස්වීම් අංක VPS/2022/12/14/553 යටතේ තීරණයක් සම්මත වී ඇත.

| | |
|---|---|
| කළුගල් කියුබ් 01 සඳහා | රු. 70.00 |
| බොරළු/පස්/ලිංපස්/වැලි කියුබ් 01 සඳහා | රු. 250.00 |

එස්. එම්. කසුන් ත්‍යාග ශ්‍රී අලගල්ල,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2023 ජනවාරි මස 20 වැනි දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊරට්පෙරියකුලම.

01-338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.